# ජනාධිපති කාර්යාලය
# சனாதிபதி அலுவலகம்
# PRESIDENTIAL SECRETARIAT

චක්‍රලේඛ අංකය : SP/SB/02/15

මගේ අංකය : SB/02/01/චක්‍රලේඛ

2015 පෙබරවාරි මස 05 දින

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත,

**පසුගිය රජයේ අමාත්‍යවරුන්, නියෝජ්‍ය අමාත්‍යවරුන් සහ මන්ත්‍රීවරුන් වෙත නිල ප්‍රවාහන පහසුකම් ලබාදීම**

රජයේ දින සියයේ වැඩසටහන සැලසුම් කරන ලද පරිදි ඵලදායීව, කඩිනමින් ක්‍රියාත්මක කිරීම කෙරෙහි රජයේ ප්‍රමුඛ අවධානය යොමුව ඇති අතර, එහි කටයුතු අධීක්ෂණය කිරීම සඳහා අධීක්ෂණ කමිටු ස්ථාපිත කිරීමට සැලසුම් කර ඇත. එම අධීක්ෂණ කමිටුවලට සම්බන්ධවී එකී කමිටු වෙත පැවරී ඇති කාර්යභාරය ඉටු කිරීම සඳහා සහාය දීමට ඉදිරිපත් වන හිටපු අමාත්‍යවරුන්, නියෝජ්‍ය අමාත්‍යවරුන් ඇතුළු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ඒ සඳහා අවස්ථාව සලසා දීමට අතිගරු ජනාධිපතිතුමා විසින් තීරණය කරන ලදී.

එම කමිටුවල කටයුතු සඳහා සක්‍රියව සහභාගීවීමට හැකිවන පරිදි හිටපු අමාත්‍යවරුන්, නියෝජ්‍ය අමාත්‍යවරුන් ඇතුළු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට පහත සඳහන් පරිදි නිල ප්‍රවාහන පහසුකම් සලසා දීමට 2015.01.28 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබාදී ඇත (අමාත්‍ය මණ්ඩල තීරණයේ පිටපතක් අමුණා ඇත).

1. ඒ අනුව, හිටපු අමාත්‍යවරුන්ට, නියෝජ්‍ය අමාත්‍යවරුන්ට සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට නිල ප්‍රවාහන පහසුකම් සලසන අතර, එහිදී හිටපු අමාත්‍යවරුන්ට සහ නියෝජ්‍ය අමාත්‍යවරුන්ට නිල වාහන දෙක (02) බැගින් සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට එක් නිල වාහනයක් බැගින් ලබාදෙනු ඇත. එවකට පැවති ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් මේ වන විටත් කවර හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට වාහනයක් වෙන් කර දී ඇත්නම්, එම වාහනය මෙම වැඩපිළිවෙල යටතේ වෙන් කර දෙනු ලබන නිල වාහනයක් වශයෙන් සැලකිය යුතුය.

2 හිටපු අමාත්‍යවරුන්ට හා නියෝජ්‍ය අමාත්‍යවරුන්ට ඔවුන් අමාත්‍ය හෝ නියෝජ්‍ය අමාත්‍ය ධූරය දැරූ විෂයය දැනට පැවරී ඇති අමාත්‍යාංශය විසින් වාහන පහසුකම් සැලසිය යුතු අතර ඒ සඳහා ඉන්ධන ලබාදීම, වාහන නඩත්තු කිරීම සහ රියදුරන් සම්බන්ධ කටයුතු එම අමාත්‍යාංශය විසින්ම ඉටු කළයුතුය. තවද, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට උක්ත අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි පත් කෙරෙන අමාත්‍යවරුන්ගෙන් සැදුම්ලත් කමිටුවේ මග පෙන්වීම යටතේ ජනමාධ්‍ය හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය විසින් වාහන පහසුකම් සලසන අතර, එසේ ලබාදෙන වාහනවලට ඉන්ධන ලබාදීම, වාහන නඩත්තු කිරීම හා රියදුරන් සම්බන්ධ කටයුතු ද එම අමාත්‍යාංශය විසින්ම ඉටු කළයුතුය.

3 හිටපු අමාත්‍යවරුන්ට සහ නියෝජ්‍ය අමාත්‍යවරුන්ට රියදුරන් දෙදෙනෙකු (02) බැගින් හා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට එක් රියදුරෙකු බැගින් අනුයුක්ත කළ යුතුය.

4. මෙසේ පැවරෙන වාහනවලට මගේ අංක CA/1/17/1 හා 2005.10.14 දිනැති රාජ්‍ය වියදම් කළමනාකරණය පිළිබඳ චක්‍රලේඛයේ සඳහන් උපදෙස් ප්‍රකාරව නියෝජ්‍ය අමාත්‍යවරයෙකුට අදාළ ඉන්ධන ප්‍රමාණය ලබාදිය යුතුය.

ඉහත සඳහන් විධිවිධාන ප්‍රකාරව අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස කාරුණිකව දන්වමි.

පී බී අබේකෝන්
ජනාධිපති ලේකම්

පිටපත් -:
01. අග්‍රාමාත්‍ය ලේකම් - අ.ක.ස
02. අමාත්‍ය මණ්ඩල ලේකම් - දැ.ගැ.ස

(මෙම චක්‍රලේඛයේ ඉංග්‍රීසි හා දෙමළ පරිවර්තන මේ සමග අමුණා ඇත)

ගාලු මුවදොර, කොළඹ 01
காலி முகத்திடல், கொழும்பு 01
Galle Face, Colombo 01
දුරකථන / தொலைபேசி / Telephones: ++ 94 (0) 11 2354418, ++ 94 (0) 11 2473873
ෆැක්ස් / தொலைநகல் / Fax: ++ 94 11 2446657
ඉ-තැපෑල / மின்-அஞ்சல் / e-mail: prsec@presidentsoffice.lk

ජනාධිපති කාර්යාලය
சனாதிபதி அலுவலகம்
PRESIDENTIAL SECRETARIAT

Circular No : SP/SB/02/15

My No : SB/02/01/Circulars
February 05, 2015

**To : All Secretaries to Ministries**

**Provision of official transport to former Ministers and Deputy Ministers and Members of Parliament**

The foremost attention of the Government is focused on the effective and speedy implementation of the 100 day programme of the Government as already planned, and monitoring committees have been planned to be launched to monitor its implementation. His Excellency the President has decided to provide an opportunity for the Members of Parliament including former Ministers/ Deputy Ministers who volunteer to assist in the task assigned to these monitoring committees, to do so thus facilitating their operational activities.

At the meeting of the Cabinet of Ministers held on 28.01.2015, approval was granted for the provision of official transport to Members of the Parliament including former Ministers/Deputy Ministers as indicated below, thus enabling them to become actively involved in the activities of the above monitoring committees (a copy of the Cabinet decision is annexed).

1. Accordingly, official transport will be provided for Members of Parliament including former Ministers/Deputy Ministers. Former Ministers and Deputy Ministers are each to be provided with two(02) vehicles whilst Members of Parliament are each to be provided with one vehicle. In case any Member of Parliament has already been allocated a vehicle by the then Ministry of Economic Affairs, that particular vehicle may be assumed to be the vehicle to be allocated under this programme.

2. Former Ministers and Deputy Ministers should be provided with transport by the Ministry which is now assigned the subject handled by them previously as Ministers / Deputy Ministers. The supply of fuel, maintenance of vehicles and duties relating to drivers are to be attended to by the said Ministry. The Members of Parliament are to be provided with transport by the Ministry of Mass Media and Parliamentary Affairs under the guidance of the Ministerial Committee appointed in pursuance of the said Cabinet decision and the supply of fuel, maintenance of vehicles and duties relating to drivers are to be attended to by the said Ministry.

3. Former Ministers and Deputy Ministers are each to be allocated two (02) drivers whilst Members of Parliament are each to be allocated one driver.

4. Vehicles so allocated should be provided with the quantity of fuel applicable to a Deputy Minister in terms of the instructions spelt out in my Circular No.CA/1/17/1 dated 14.10.2005 on Management of State Expenditure.

You are kindly requested to initiate action as provided for above.

**P B Abeykoon**
Secretary to the President

Copies : 1. Secretary to the Prime Minister - For necessary action
2. Secretary to the Cabinet of Ministers - For necessary action

(Copies of the Sinhala and Tamil versions of this circular are annexed)

ගාලු මුවදොර, කොළඹ 01
காலி முகத்திடல், கொழும்பு 01
Galle Face, Colombo 01
දුරකථන / தொலைபேசி / Telephones ++ 94 (0) 11 2354418, ++ 94 (0) 11 2473873
ෆැක්ස් / தொலைநகல் / Fax ++ 94 11 2446657
ඊ-තැපෑල / மின்-அஞ்சல் / e-mail prsec@presidentsoffice.lk